දුරකථන /தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, Fax: 2784825

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. ....................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.

'இசுருபாய'
பத்தரமுல்ல.

"Isurupaya"
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. ED/ 1/9/1/1/04(i)

දිනය / திகதி / Date 2010.03.09

චක්‍රලේඛ අංක : 2010 / 09

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්.
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්.
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්.
සියලු ම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්.
සියලු ම පාසල් ප්‍රධානීන් (ප්‍රාථමික පන්ති පැවැත්වෙන පාසල්වල) වෙත.

## ප්‍රාථමික අධ්‍යාපනයේ ඇගයීම් හා තක්සේරු ක්‍රියාවලිය ක්‍රමවත් කිරීම.

01 ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලා ක්‍රියාත්මක කිරීම සඳහා නිකුත් කරන ලද, 2006.12.22 දිනැති අංක 2006/49, 2007.12.13 දිනැති අංක 2007/29 හා 2008.12.05 දිනැති අංක 2008/49 හා බැඳුණු චක්‍රලේඛයන්ට අමතර වශයෙනි.

02 1998 වර්ෂයේ සිට හඳුන්වා දී 2007,2008 හා 2009 වර්ෂවල දී නැවත සංස්කරණය වූ 1,2,3,4,5 ශ්‍රේණිවල විෂයමාලාව මගින් හඳුන්වාදුන් නවාංග ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව නැවත අවධාරණය කරන අතර, පාසල්වල ක්‍රියාත්මක කිරීමට අදාළ ඇගයීම් හා තක්සේරු ක්‍රියාවලිය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරනු පිණිස මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

03 පළමුවන ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය තෙක් වන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල අවසානයේ දක්වා ඇති පරිදි තක්සේරු පත්‍රිකාවල අඩංගු අභිමත නිපුණතා කෙරෙහි සිසුන් යොමු කිරීම පිණිස පන්ති කාමරය තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම අවශ්‍ය වේ.

04 විවිධ සාධක හේතුවෙන් පන්ති කාමරයේ සිසුන් සෑම දෙනෙකුට ම අභිමත නිපුණතාවලට ළඟා වීමට නොහැකි අවස්ථා තිබිය හැකිය. එසේ වුවත් සියලු ම සිසුන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා මට්ටමට ළඟා කරවීම සඳහා ගුරුවරයාගේ වගවීම ඉතා අවශ්‍ය වේ.

05 1 හා 2 ශ්‍රේණි පළමුවන ප්‍රධාන අවධිය ද , 3 හා 4 ශ්‍රේණි දෙවන ප්‍රධාන අවධිය ද සහ 5 ශ්‍රේණිය තෙවන ප්‍රධාන අවධිය ද ලෙස හඳුන්වා දෙමින් එක් එක් අවධිය සඳහා අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා ජාතික අධ්‍යාපන ආයතනය විසින් සකස් කර පාසල්වලට ලබාදී ඇත. එක් අවධියක් අවසාන වන විට පන්තියේ සෑම ශිෂ්‍යයකු ම එම අවධියට නියමිත අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා කරා ගෙන ඒම සඳහා එම ප්‍රධාන අවධිය භාර ගුරුවරයා වගවිය යුතු බව නැවත අවධාරණය කරමි.

06 එක් ප්‍රධාන අවධියක් සඳහා එක් ගුරුවරයකු යොදවා ගැනීමට පාසල් කළමනාකරණයට මින් පෙර චක්‍රලේඛ මගින් පවරා ඇති බලතල තවදුරටත් ඒ අයුරින් ම ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කෙරේ.

07 අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා කරා ළඟා නොවූ සිසුන් ඇත්නම් සුදුසු ප්‍රතිකාර්ය ක්‍රියාකාරකම් මගින් ඔවුන් ද අදාළ අවධිය අවසාන වීමට පෙර නිපුණතා කරා ළඟා කරවීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

08 අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා ක්‍රියාත්මක කිරීමේදී පහත දැක්වෙන කරුණු පිළිබඳව විශේෂ අවධානය යොමු විය යුතුය.

i ප්‍රධාන අවධියක ආරම්භයේ සිට ම පන්තියේ සිසුන් නියමිත අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා කරා ළඟාවීම පිළිබඳ තොරතුරු විධිමත් ව පවත්වාගෙන යාම සහ එම තොරතුරු ඇසුරින් නිගමනවලට එළඹීම.

ii එක් එක් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා අත්කර ගත් සිසුන් සඳහා "✓ " ලකුණ ද එම එක් එක් නිපුණතා කරා ළඟා වීමට උදව් ලැබිය යුතු සිසුන් සඳහා " •" ලකුණ ද ප්‍රදානය කිරීම.

iii " •" ලකුණු ලබා ගත් සිසුන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සුදුසු ප්‍රතිකාර්ය ක්‍රියාකාරකම් මගින් ඔවුන් එම අවධිය අවසන් වන විට අදාළ අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා පිළිබඳ ප්‍රවීණත්වයට පත්කර වන බවට වගවීම.

09 අභිමත ඉගෙනුම් නිපුණතා ක්‍රියාත්මක කිරීමේදී පහත දැක්වෙන කරුණු පිළිබඳ ව විශේෂ අවධානය යොමු විය යුතුය.

i පළමුවන ප්‍රධාන අවධියේ දී වාර අවසාන විධිමත් ලිඛිත පරීක්ෂණ නොපැවැත්වීම. අභිමත නිපුණතා පිළිබඳ ව නිගමනවලට එළඹීමේදී ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල ඇතුළත් කර ඇති තක්සේරු පත්‍රිකාවල නිර්ණායකවලට අනුව සන්තතික ව රැස් කරන තොරතුරු සැලකිල්ලට ගැනීම.

ii දෙවන හා තුන්වන ප්‍රධාන අවධිවල දී ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල ඇතුළත් කර ඇති තක්සේරු පත්‍රිකාවල නිර්ණායකවලට අනුව සන්තතික ව රැස්කරනු ලබන තක්සේරු තොරතුරුවලට අමතර ව ගුරුවරයා විසින් සකස්කරනු ලබන විධිමත් ලිඛිත පරීක්ෂණ ඇසුරින් සිසු ප්‍රගතිය පිළිබඳව නිගමනවලට එළඹීම.

10 අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සහ අභිමත ඉගෙනුම් නිපුණතා පිළිබඳ තොරතුරුවලට අමතර ව සිසු සාධනය හා දක්ෂතා පිළිබඳ ව සැලකිලිමත් විය යුතු කරුණුවලට අදාළ තොරතුරු ඇතුළත් සිසුන්ගේ සාධනය පිළිබඳ වාර්තා, සිසුන් ඊළඟ අවධියට පිවිසෙන විට එම අවධිය භාර ගුරුවරයාට භාරදිය යුතු ය.

එම්.එම්.එන්.ඩී. බණ්ඩාර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :
1. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය
2. විභාග කොමසාරිස් ජනරාල් - විභාග දෙපාර්තමේන්තුව
3. සියලු ම පළාත් ප්‍රාථමික අධ්‍යාපන සම්බන්ධීකරණ නිලධාරි
4. සියලු ම කලාප ප්‍රාථමික අධ්‍යාපන සම්බන්ධීකරණ නිලධාරි

C:\Documents and Settings\131231\My Documents\HNG\Circular1.doc